# බුදු රජාණන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවය නිවනට ම පවතියි

## සක්කාරගරුකාර සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 4 - පිටු අංක 452 - 461)

යම් භික්ෂුවක්,

- ශාස්තෘන් වහන්සේට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය.
- ධර්මයට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය.
- සංඝයාට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය.
- ශික්ෂාවට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය.
- සමාධියට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය.
- අප්‍රමාදයට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේය. කුසල් වඩන්නේය.
- පිළිසඳරට සත්කාර කොට ගරුකාර කොට වාසය කරන්නේ නම් අකුසල් දුරු කරන්නේ ය කුසල් වඩන්නේය.

- එසේ ම ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැති තැනැත්තා ධර්මය කෙරෙහි ගෞරව සහිත වෙයි යන්න සිදු නොවිය හැකිය. ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැති තැනැත්තා ඒකාන්තයෙන් ම ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ වෙයි.

- එසේ ම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සහ ධර්මය කෙරෙහි ගෞරවය නැති තැනැත්තා ඒකාන්තයෙන් ම සංඝයා කෙරෙහි ද ගෞරව නැත්තෙක් වෙයි.

- එසේ ම ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි සහ සංඝයා කෙරෙහි ගෞරව නැති තැනැත්තා ඒකාන්තයෙන් ම ශික්ෂාව කෙරෙහි ද ගෞරව නැත්තෙක් වෙයි.

- එසේ ම ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි සහ ශික්ෂාව කෙරෙහි ගෞරව නැති තැනැත්තා ඒකාන්තයෙන් ම සමාධිය කෙරෙහි ද ගෞරව නැත්තෙක් වෙයි.

- එසේ ම ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි, ශික්ෂාව කෙරෙහි සහ සමාධිය කෙරෙහි ගෞරව නැති තැනැත්තා ඒකාන්තයෙන් ම අප්‍රමාදය කෙරෙහි ද ගෞරව නැත්තෙක් වෙයි.

- එසේ ම ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි, ශික්ෂාව කෙරෙහි, සමාධිය කෙරෙහි සහ අප්‍රමාදය කෙරෙහි ගෞරව නැති තැනැත්තා ඒකාන්තයෙන් ම පටිසන්ථාරය කෙරෙහි ද ගෞරව නැත්තෙක් වෙයි.

**එසේ ම යම් භික්ෂුවක්,**

- ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ, ධර්මය කෙරෙහි ගෞරව නැති ව වසන්නේය යන කරුණ විද්‍යමාන නොවෙයි. ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ නම් ඒකාන්තයෙන් ම ධර්මය කෙරෙහි ද ගෞරව ඇත්තෙක් වෙයි.

- ශාස්තෘන් වහන්සේ කෙරෙහි සහ ධර්මය කෙරෙහි ගෞරව ඇත්තේ නම් ඒකාන්තයෙන් ම සංඝයා කෙරෙහි ද ගෞරව ඇත්තෙක් වෙයි.
- ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි සහ සංඝයා කෙරෙහි ගෞරව ඇත්තේ නම් ශික්ෂාව කෙරෙහි ද ගෞරව ඇත්තෙක් වෙයි.
- ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි සහ ශික්ෂාව කෙරෙහි ගෞරව ඇත්තේ නම් සමාධිය කෙරෙහි ද ගෞරව ඇත්තෙක් වෙයි.
- ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි, ශික්ෂාව කෙරෙහි සහ සමාධිය කෙරෙහි ගෞරව ඇත්තේ නම් අප්‍රමාදය කෙරෙහි ද ගෞරව ඇත්තෙක් වෙයි.
- ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි, ශික්ෂාව කෙරෙහි, සමාධිය කෙරෙහි සහ අප්‍රමාදය කෙරෙහි ගෞරව ඇත්තේ නම් පටිසන්ථාරය කෙරෙහි ද ගෞරව ඇත්තෙක් වෙයි.